---

ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාව

කුරුණෑගල දිස්ත්‍රික්කය

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 27 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2013 ඔක්තෝබර් 09 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

1.2 මතය

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතු කොටගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ඉබ්බාගමුව ප්‍රාදේශීය සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළබඳ අදහස් දැක්වීම

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල ශේෂ පිරික්සුම රු.1,085,924 කින් තුලනය වී නොතිබුණි. ප්‍රාග්ධන වැය ගිණුම් තුල රු.2,916,722 ක ගැලපීම් වලට අදාලව ජනල් සටහන් ඉදිරිපත් නොවූ අතරම ජනල් සටහන් මගින් අවස්ථා 5 ක් යටතේ සිදුකල රු.1,515,463 ක ගැලපුම් වලට අදාලව පැහැදිලි කිරීම් ඉදිරිපත් නොවුණි.

(ආ). ඉකුත් වර්ෂයට අදාල බදුකුලී ලැබීම් ගිණුම් ගතකිරීමේදී ජ්නල් සටහන් මගින් හිඟහිටි බදු කුලී ගිණුම රු.819,392 ක් හර හා බදුකුලී ගිණුම රු.819,392 ක් බැර කිරීමෙන් බදු කුලී ආදායම හා ආදායම් ණයගැතියන් රු.1,638,784 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ). ලේඛනය අනුව වැටුප් ප්‍රතිපූර්ණ රු.25,553,979 ක් වුවද, ආදායම් හා වියදම් ගිණුමට එය රු.27,194,561 ක් ලෙස ගෙන තිබීමෙන් වර්ෂයට අදාල වැටුප් ප්‍රතිපූර්ණ රු.1,640,582 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඈ). ආදායම් හා වියදම් ගිණුමෙහි වූ රු.87,828,172 ක ප්‍රාග්ධන වියදම තුල ඉකුත් වර්ෂය වෙනුවෙන් ගෙවූ රු.60,868,876 ක් ඇතුලත්ව තිබීමෙන් ප්‍රාග්ධන වියදම රු.60,868,876 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ගෙවිය යුතු රු.63,591,151 ක් ප්‍රාග්ධන වියදමක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඉ). ආදායම් හා වියදම් ගිණුමෙහි වූ රු.89,241,820 ක ප්‍රාග්ධන ආධාර ලැබීම් තුල ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබූ රු.45,712,557 ක්ද ඇතුලත්ව තිබීමෙන් ප්‍රාග්ධන ආදායම රු.45,712,557

ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම ලැබිය යුතු ප්‍රාග්ධන ආධාර රු.59,723,341 ක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබුණි.

(ඊ). කර්මාන්ත ණයගැතියන් ලෙස රු.14,510,484 ක් ප්‍රතිපාදනය කර පැවතියද කර්මාන්ත ආධාර ලෙස රු.45,212,557 ක් ලැබී තිබූ අතර එයින් ඉකුත් වර්ෂය වෙනුවෙන් ප්‍රතිපාදනය කර තිබූ රු.14,510,484 ක් කර්මාන්ත ණයගැති ගිණුමට බැරකල යුතු වුවත්, එම ගිණුම හර කර තිබුණි. එමෙන්ම ප්‍රතිපාදනය කර නොතිබූ රු.30,702,073 ක් සමුච්චිත අරමුදලට ගැලපීම වෙනවට ආදායම් හා වියදම් ගිණුමට ගිණුම් ගත කර තිබුණි.

(උ). සභා කාර්යාලය ඉදිකිරීමට අදාල කර්මාන්ත ලිපි ගොනුව අනුව එකී ගොඩනැගිල්ලේ තත්‍ය වියදම රු.12,769,382 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.8,235,660 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.4,533,722 කින් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඌ). ඉබ්බාගමුව මහජන පුස්තකාලය රු.1,365,000 ක් වැයකර ඉදිකර තිබුණද එකී වටිනාකම ඉඩම් හා ගොඩනැගිලි යටතේ මූල්‍ය ප්‍රකාශන වලට ගෙන නොතිබීමෙන් ඉඩම් හා ගොඩනැගිලි අගය රු.1,365,000 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(එ). දායක මුදල් ලෙස විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට ගෙවිය යුතු රු.4,413,625 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශන වල ණයහිමියන් ලෙස හා වර්ෂයට අදාල රු.129,636 ක ප්‍රමාණය වියදමක් ලෙස ගිණුම් ගතකර නොතිබුණි.

(ඒ). 2010 හා 2012 වර්ෂයන්ට අදාල මුද්දර ගාස්තු රු.30,000,000 ක් බිල් කර තිබූ අතර එයින් ලැබී තිබූ රු.1,000,000 ක ප්‍රමාණය අඩුකල පසු ලැබිය යුතු මුද්දර ගාස්තු රු.29,000,000 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.18,822,248 ක් ලෙස ගෙන තිබීම හේතුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම රු.10,177,752 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඔ). හිඟ උසාවි දඩ ආදායම ලෙස රු.5,980,250 ක් මූල්‍ය ප්‍රකාශන වලට ගෙන තිබුණ ද අදාල ලේඛන අනුව තත්‍ය ලෙස ලැබිය යුතු ප්‍රමාණය රු.2,151,219 ක් වීමෙන් ලැබිය යුතු උසාවි දඩ රු.3,829,031 ක් හා වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.1,376,905 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

1.3.2 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.29,143,827ක් වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,827,498 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.9,321,780 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තු ගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු. 000 | රු. 000 | රු. 000 |
| (i) | වරිපනම් හා බදු | 1,749 | 163 | 111 |
| (ii) | බදුකුලී | 6,816 | 6,575 | 240 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,255 | 886 | 368 |
| (iv) | වෙනත් ආදායම් | 52,924 | 53,408 | 484 |

#### 2.2.2 වරිපනම් බදු

වර්ෂය අවසානයට පැවති රු.2,707,266 ක වරිපනම් බදු හිඟ ශේෂය තුල දඹුළු පාර වම, වරිපනම් අංක 279 ස්ථානයේ පිහිටි කාර්තුවකට රු.2,104 ක් බිල් කරන ගොඩනැගිල්ලට අදාලව රු.127,629 ක හිඟ වරිපනම් බදු ශේෂයක් පැවතුණි.

#### 2.2.3 බදුකුලී

බදුකුලී ලේඛණය අනුව සමාලෝචිත වර්ෂය අවසානයට රු.94,781 ක හිඟයක් දැක්වුවද, හිඟ ගිණුම් අනුව රු.2,891,477 ක් විය. හිඟ සම්බන්ධ විස්තර සොයා බලා අදාල හිඟ අයකිරීමට කටයුතු කිරීමට සභාව පියවර ගෙන නොතිබුණි.

#### 2.2.4 විනෝද බදු

මැල්සිරිපුර තිබූ සිනමා ශාලාවක වර්ෂ ගණනාවක සිට පැවත එන විනෝද බදු හිඟය රු.59,215 ක් වූ අතර එකී හිඟය අයකර ගැනීමට සභාව කටයුතු කර නොතිබුණි.

2.2.5 දුරකථන සම්ප්‍රේෂණ කුළුණු සඳහා පෙරසැරි ගාස්තු

සභා බල ප්‍රදේශයේ දුරකථන සම්ප්‍රේෂණ කුළුණු 8 ක් හඳුනාගෙන තිබූ අතර, සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කුළුණු පිළිබඳ කාලානුරූපීව සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. වාර්ෂික වෙළඳ බලපත්‍ර හෝ ව්‍යාපාර බදු අයකිරීමක්ද කර නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.3,934,856 ක් හා ලැබිය යුතු මුද්දර ගාසතු රු.8,150,628 ක් විය.

2.3 වාහන පාලනය

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සභාව සතුව පැවති වාහන 8 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී ඉන්ධන වියදම රු.2,683,672 ක් වූ අතර, එයින් 28.6% ක් ලෙස රු.769,040 ක් පී.ඩී, 1844 අංක දරණ කැබ් රථය සඳහා වැයකර තිබුණි. මෙකී වාහනයට අදාල ධාවන සටහන් 2012 ජූනි සිට ලියා නොතිබුණු අතර, වර්ෂය තුල මාසිකව රු.18,110 ත් රු.92,767 ත් පරාසයක ඉන්ධන ලීටර් 6783.3 ක් වෙනුවෙන් රු.769,040 ක් හා 2013 ජනවාරි සිට මැයි දක්වා මාසිකව රු.43,776 ත් රු.112,473 ත් අතර පරාසයක ඉන්ධන ලීටර් 3614 ක් වෙනුවෙන් රු.431,110 ක් වැයකර තිබුණි.

(ආ). සභාවට අයත් L.E. 7443 මහේන්ද්‍රා ට්‍රැක්ටරයට අදාලව රු.4,147 ක් වූ ඉන්ධන ඩීසල් ලීටර් 36 ක ඌණතාවයක් සිදුවී ඇති බව සභා ලේකම්වරයා විසින් හඳුනාගෙන තිබුණද, ඊට අදාලව විධිමත් පරීක්ෂණයක් සිදුකර නොතිබූ අතර, පළාත් පාලන කොමසාරිස් විසින් මේ සම්බන්ධයෙන් අවවාද ලිපියක් නිකුත් කිරීමට සභාවට නියෝග කිරීමක් පමණක් සිදුකර තිබුණි.

(ඇ). සභාව සතු PD-1844 දරන වාහනයට 2012 පෙබරවාරි 11 දින සිදුවූ අනතුර සම්බන්ධව රියදුරු විසින් කාර්යාලයට වාර්තා කර නොතිබුණ අතර අදාල ධාවන සටහන් වල හා ලොග් පොතේද ඒ පිළිබඳව සටහන් කර නොතිබුණි. ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 103 ප්‍රකාරව අනතුර සම්බන්ධව මූලික පරීක්ෂණයක් පවත්වා නොතිබූ අතර විධිමත් ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියක් අනුගමනය කිරීමකින් තොරව හානි වී තිබූ ඉදිරිපස වීදුරුව නැවත සවිකිරීමට සභා අරමුදලින් රු.119,575 ක් වැයකර තිබුණි.

2.4 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

සභාවට අයත් ගොකරැල්ල උපකාර්යාල බල පදේශයේ පිහිටි ස්වයං රැකියා මධ්‍යස්ථානය වර්ෂ 10 කට පෙර සිට වසා දමා තිබූ අතර එහි රු.313,032 ක වටිනාකමට වත්කම් පැවති අතර අගය නොකල පරිත්‍යාග ලෙස ලැබී තිබූ ජුකී මැෂින් 8 ක්ද පැවතුණි.

---

2.5 වත්කම් කළමනාකරණය

මූල්‍ය ප්‍රකාශන අනුව ඉඩම් හා ගොඩනැගිලි වටිනාකම රු.21,381,172 ක් විය.1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති මාලාවේ 218 රීතිය ප්‍රකාරව සියළු ඉඩම් හා ගොඩනැගිලි සමීක්ෂණයක් සිදුකර සභාවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රමාණය තහවුරු කරගෙන ගිණුම් ගතකර නොතිබුණි.

2.6 සභාවට එරෙහිව ආරම්භ කර ඇති නෛතික කරුණු

(අ). ප්‍රාදේශිය සභාව විසින් දරම්ටිපොල-මුවගම මාර්ගයේ පැවති 12 ' පෙට්ටි බෝක්කුව ඉවත්කර 20' බෝක්කුවක් 2002 වර්ෂයේ රු.41,750 ක් වැයකර ඉදිකර තිබූ අතර ඒ හේතුවෙන් ආසන්න කුඹුරු හිමියාට වූ අලාභය වෙනුවෙන් කුඹුරු හිමියා විසින් සභාවට එරෙහිව පවරා තිබූ නඩුවේ තීන්දුව ප්‍රකාරව රු.120,000 ක වන්දියක් හා රු.25,347 ක නඩු ගාස්තුවක් ගෙවීමට හා අදාල බෝක්කුව පෙර තිබූ පරිදි ඉදිකිරීමට නියෝග කර තිබුණි. අදාල වන්දි මුදල වූ රු.145,347 ක් හා බෝක්කුව පැරණි තත්ත්වයට පත්කිරීම සඳහා රු.210,000 ක් වර්ෂය තුල සභා අරමුදලින් වැයකර තිබුණි.

(ආ). සභාව විධිමත් නඩු ලේඛණයක් පවත්වා නොතිබුණු අතරම හිඟ කඩකුලී අයකර ගැනිම සඳහා පවරා තිබූ නඩුවල අවසාන තින්දුව හා එම තීන්දු ක්‍රියාත්මක කිරිම පිළිබඳ පැහැදිලි කර ගැනිම අපහසු විය.

2.7 මෙහෙයුම් අකාර්යක්ෂමතා

පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ). වැය විෂයයන් 3 ක් යටතේ රු.5,106,000 ක වියදමක් දැරිමට අපේක්ෂා කළද, ඉන් වැයකර පැවතියේ 38% ලෙස රු.1,930,892 ක් පමණි.

(ආ). සභාව විසින් පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එකී අරමුදලට ගෙවිය යුතු ශේෂය රු…4,413,625 ව තිබුණි. එමෙන්ම සභාවට අදාල මාසක වාරිකය ලෙස රු…10,803 බැගින් එකී අරමුදල විසින් අයකර පැවතියද, එකී අයකිරීම් සභාවේ කුමන සේවකයන්ට අදාලවද යන්න සභාව දැනුවත් වී නොතිබුණි.

(ඇ) මැල්සිරිපුර බස්නැවතුම්පල ගොඩනැගිලි ඉදිකිරීම් කර්මාන්තය සඳහා කොන්ත්‍රාත්කරුට 2012 වර්ෂය තුලදී රු.2,112,904 ක් හා 2013 වර්ෂයේ දි රු.1,874,471 ක් ගෙවීම් කර තිබූ අතර ඊට අදාල එකතු කළ අගය මත බදු මුදල් පිළිවෙලින් රු.251,536 ක් හා රු.200,836 ක් ලෙස රු.452,372 ක් සභාව විසින් ගෙවිය යුතු බදු ගණනයේදී ගෙවූ බදු ලෙස අඩුකර දක්වා නොතිබුණි.

2.8 <u>ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය</u>

සමාලෝචිත වර්ෂයේ දී කසළ කළමනාකරණ ව්‍යාපෘතිය සඳහා රු.1,290,000 ක වටිනාකමට ට්‍රැක්ටර් 03 ක් මිලදී ගෙන තිබුණද, කසල කළමනාකරණය සඳහා ගොඩනැගිල්ලක් ඉදිකිරීමට ඉඩමක් සොයාගෙන නොතිබුණි. සභා බල ප්‍රදේශයේ එකතු වන කුණු, වලවල් වලට දමා වැළලීමේ ක්‍රමයක් සභාව අනුගමනය කරමින් පැවතුණි.

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ) මූල්‍ය පාලනය

(ඇ) ආදායම් පරිපාලනය

(ඈ). වත්කම් කළමනාකරණය

(ඉ) වාහන උපයෝජනය